ජනයුගය

නයන තරංග ගමගේ

පළාත් පාලන මැතිවරණය මේ වසරේ පැවැත්වීමට නොහැකි බව මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා ඊයේ (12දා) ප්‍රකාශ කළේය.

කෙසේ වෙතත් ලබන වසරේ (2018) ජනවාරි මාසයේදී පළාත් පාලන මැතිවරණය පැවැත්වීමේ හැකියාව පවතින බවත්, ඒ සඳහා දින කිහිපයක් හඳුනාගෙන ඇති බවත් මැතිවරණ කොමිසමේ සභාපතිවරයා ප්‍රකාශ කළේ එම කොමිෂන් සභා පරිශ්‍රයේ ඊයේ පැවැති ආසියානු මැතිවරණ නිරීක්ෂණ ජාලය සමග අවබෝධතා ගිවිසුමකට එළැඹීමේ අවස්ථාවට සහභාගි වෙමිනි. ආසියානු කලාපයේ සියලුම රටවල මැතිවරණ හා සම්බන්ධ ආයතන සමග එක්ව ශ්‍රී ලංකාවේදී සමුළුවක් පැවැත්වීමේ එකඟතාව මෙම අවස්ථාවේදී සිදුවිය.

මෙහිදී අදහස් දැක්වූ මහින්ද දේශප්‍රිය මහතා ජනවාරි මාසයේ 06, 20 සහ 27 යන දින අතුරින් පළාත් පාලන මැතිවරණය පැවැත්වීමේ නිශ්චිත දිනය කොමිසම විසින් ඉදිරියේදී නිවේදනය කරන බවයි.

හැකි තරම් ඉක්මනින් මැතිවරණ පැවැත්වීමට සිය පාර්ශ්වය කැමැත්ත පළ කළද අපේක්ෂකයන් තෝරා ගැනීම සඳහා දේශපාලන පක්ෂවලට සාධාරණ කාලයක් ලබා දීම සහ අපේක්ෂක ලැයිස්තුවලට අනිවාර්යයෙන්ම 25%ක කාන්තා නියෝජනයක් ඇතුළත් කිරීම සඳහා අවස්ථාව ලබා දීමට සිදුවන බවද සභාපතිවරයා මෙහිදී වැඩිදුරටත් සඳහන් කළේය.